# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි තනතුරේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් සබරගමුව පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. පවතින පුරප්පාඩු සංඛ්‍යාව** :- 02

**02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය** :- 2026.06.11

**03. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 18 ට නොඅඩු සහ 30ට නොවැඩි විය යුතුය.**

**04. බඳවා ගැනීමේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :-**

| අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|
| අ.පො.ස.(සා.පෙළ) සුදුසුකම | අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම | |
| මව්බස (සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම. | අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ජීව විද්‍යා විෂයය ධාරාව (ජීව විද්‍යාව සමග රසායන විද්‍යාව, භෞතික විද්‍යාව කෘෂි විද්‍යාව, යන විෂයයන්ගෙන් 2ක්) හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ (ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂනවේදය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව) විෂයයන් තුනකින් එකවර සමත් වී තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂයයක් ලෙස ගණන් නොගැනේ.) | I. කුණ්ඩසාලේ, අඟුණකොලපැලැස්ස පැල්වෙහෙර, බිබිල, ලබුදුව, වාරියපොළ, වව්නියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ දෙවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>II. තෘතියික සහ වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෙවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව ලබා තිබීම.<br>හෝ<br>III. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි කාර්මික ආයතනයෙන් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>IV. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තිය කුසලතා (NVQ 6) හයවන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.<br>හෝ<br>V. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (කෘෂිකර්ම) ලබා තිබීම. |

**05. තනතුරට අදාළ වැටුප් පරිමාණය :-**

අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම තනතුරේ III ශ්‍රේණියට අදාල වැටුප් කාණ්ඩය MN 3-2025 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 52,250-10X800-11X1190-10X1320-10X1350 - රු. 100,040/- වේ.

**06.** මෙම තනතුරට බඳවා ගැනීමේ සම්පූර්ණ නිවේදනය සහ ආදර්ශ අයදුම්පත්‍රය www.sg.gov.lk හා www.psc.sg.gov.lk වෙබ් අඩවිවල පළ කර ඇත.

**ඩබ්. ආර්. දිනීෂා එස්. රත්නායක**
**ලේකම්**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, සබරගමුව පළාත.**
**2026.05.08**